# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1922/30 - 2015 ජූලි මස 08 වැනි බදාදා - 2015.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කැගල්ල ජල සම්පාදන ක්‍රමයේ බෙදා හැරීමේ ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උප ලේඛණයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නාගරික සංවර්ධන, ජල සම්පාදන<br>
හා ජලාපවහන අමාත්‍ය.

2015 ජූනි මස 26 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1118

#### උපලේඛනය

කැගල්ල දිස්ත්‍රික්කයේ, කැගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දික්ඇල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දික්ඇල්ල ජනපදය ගමේ පිහිටි දික්ඇල්ල වත්ත නැමති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 08 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක ඒ 1223 දරන මූලික පිඹුරේ කැබලි අංක 36 ; |
| *නැගෙනහිරට* | : | අංක ඒ 1223 දරන මූලික පිඹුරේ කැබලි අංක 36 ; |
| *දකුණට* | : | අංක ඒ 1223 දරන මූලික පිඹුරේ කැබලි අංක 35 න් කොටසක් ; |
| *බටහිරට* | : | මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : එච්. ආර්. නන්දාවතී මහත්මිය,<br>
අංක 44, දික්ඇල්ල,<br>
කැගල්ල.

07 - 1108


1A - G 21861 — 16 (2015/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇටම්පිටිය ජල සම්පාදන ක්‍රමය යටතේ පල්ලේගම තවලන්තැන්න ජල පොම්පාගාරය හා ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උප ලේඛණයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නාගරික සංවර්ධන, ජල සම්පාදන<br>
හා ජලාපවහන අමාත්‍ය.

2015 ජුනි මස 26 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1120

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 55 ඒ පල්ලේගම වසම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඇටම්පිටිය වත්ත තවලන්තැන්න කොටස ගමේ පිහිටි තවලන්තැන්න වත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 80 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,<br>
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,<br>
කොළඹ 07.

07 - 1109

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.